# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,841 - 2013 දෙසැම්බර් මස 13 වැනි සිකුරාදා - 2013.12.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 2014 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2018 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ජනවාරි මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 දෙසැම්බර් මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


2011 - B 80792—3,840 (2013/12)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරීත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 ජනවාරි මස 13 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 නොවැම්බර් මස 19 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ගාල්ල | නාගොඩ | ගාල්ල දිස්ත්‍රික්කයේ මලාමුර කොට්ඨාසයේ උප්පැන්න මරණ හා ගඟබඩ පත්තුව කොට්ඨාසයේ විවාහ රෙජිස්ට්‍රාර් ධුරය(සාමාන්‍ය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |

12-381

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 ජනවාරි මස 13 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 නොවැම්බර් මස 25 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ගාල්ල | නියාගම | නාරංඕවිට කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ බෙන්තර වලල්ලාවිට කෝරළ කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |

12-467

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මාතලේ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්‍ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 ජනවාරි මස 13 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 නොවැම්බර් මස 27 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතලේ | රත්තොට | මාතලේ දිස්ත්‍රික්කයේ පල්ලේසිය කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා මාතලේ නැගෙනහිර විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ. |

12-564

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කුරුණෑගල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්‍ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 ජනවාරි මස 13 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 නොවැම්බර් මස 19 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කුරුණෑගල | අලව්ව | කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණි උඩුකහ දකුණ කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා දඹදෙණි හත්පත්තුව කොට්ඨාසයේ විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (උඩරට/සාමාන්‍ය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |

12-382

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය

**නීති නිලධාරි (විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම**

රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබාගන්නා අපේක්ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම්*

(i) *අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්* :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) *පළපුරුද්ද* :
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු සක්‍රිය වෘත්තීය පළපුරුද්දක තිබීම.

(iii) *කායික සුදුසුකම්* :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(iv) *වෙනත්* :

* දෙමළ භාෂා හා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය අමතර සුදුසුකමක් වේ.
* ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
* අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
* අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණකර තිබිය යුතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. නීති නිලධාරි iii වැනි ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු ය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවාවට බැඳුනු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලට ද මෙම පත්වීම යටත් වේ.

04. *වයස් සීමාව*

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

05. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට රු. 22,935 -10 x 645 - 8 x 790 - 17 x 1,050 - රු. 53,555 මාසික වැටුප් පරිමාණයක් හිමිය. (2006.04.25 දිනැති රා. ප. ච අංක 6/2006 හා අංක SL-1-2006 වැටුප් ඛණ්ඩය)

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ.

| | *විෂයය* | *උපරිම ලකුණු* |
|---|---|---|
| 01. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| 02. | අතිරේක වෘත්තීය සුදුසුකම් | 15 |
| 03. | අතිරේක පළපුරුද්ද | 30 |
| 04. | පරිගණක සාක්ෂරතාව | 15 |
| 05. | ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව | 15 |
| 06. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | 05 |
| | *මුළු එකතුව* | 100 |

07. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය* :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල්පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. *අයදුම්පත් ඉදිරිපත් කිරීම* :

(i) අයදුම්පත් 2014.01.03 දිනට හෝ එදිනට ප්‍රථම ලේකම්, රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය, අංක 561/3, ඇල්විටිගල මාවත, කොළඹ 05 යන ලිපිනයට ලැබෙන සේ

ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 08 දක්වාත්, 2 වන පිටුව අංක 09 සිට 11 දක්වාත් 03 වන පිටුව අංක 12 සිට 17 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කල යුතු ය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහල වම් කෙළවරේ "නීති නිලධාරි (ස්ථිර) තනතුර සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු/සාමදාන විනිශ්චයකාරවරයකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු. 22, 935 ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධරයකු විසින් සහතික කළ යුතු ය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(iv) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකුල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. සාවද්‍ය තොරතුරු සැපයීම

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය.

අංක 561/3, ඇල්විටිගල මාවත,
කොළඹ 05.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

***රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය***

නීති නිලධාරි තනතුර (විධායක සේවා ගණයේ III ශ්‍රේණිය)

(1) (i) මුල්'කුරු සමග අගට යෙදෙන නම (සිංහල) :—————.
(ii) මුල්'කුරු සමග අගට යෙදෙන නම (ඉංග්‍රීසි) :—————.
(iii) මුල්'කුරු වලින් හැඳින්වෙන නම් (සිංහල) :—————.
(iv) මුල්'කුරු වලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි) :—————.

(2) ලිපිනය :
(i) රාජකාරි :—————.
(ii) පෞද්ගලික :—————.

(3) දුරකථන අංකය :
(i) රාජකාරි :—————.
(ii) පෞද්ගලික :—————.

(4) (i) වර්තමාන තනතුර හා සේවා ස්ථානය :—————.
(ii) එම තනතුරට පත් වූ දිනය :—————.

(5) ජාතික හැඳුනුම්පත් අංකය :—————.

(6) (i) ස්ත්‍රී/පුරුෂ භාවය :—————.

(ii) විවාහක ද, අවිවාහක ද, වැන්දඹු ද යන වග :—————.

(7) (i) උපන් දිනය :—————.

වර්ෂය :—————. මාසය :—————. දිනය :—————.

(ii) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :
අවුරුදු :—————. මාස :—————. දින :—————.

(8) ඔබ ශ්‍රී ලංකා පුරවැසියකු වන්නේ පරම්පරාවෙන් ද? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද? :—————.

(9) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

(අ) සාමාර්ථය, වෘත්තීය හා ශිල්පීය සුදුසුකම් යනාදියේ විස්තර ද සමග සඳහන් කරන්න.

| *විභාගය* | *වර්ෂය* | *පෙනී සිටි ප්‍රධාන විෂයයන්* | *සාමාර්ථය* | *ආයතනයේ නම* |
|---|---|---|---|---|
| | | | | |

(ආ) අදාළ අයදුම්කරු ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දුන් වර්ෂය :—————.

(ඇ) අයදුම්පත් කැඳවන අවසාන දිනට නීති නිලධාරි වශයෙන් සේවය කළ කාලය :—————.

(10) පළපුරුද්ද :

(i) ආයතනය :—————.

(ii) සේවා කාලය :—————.

(11) පරිගණක ක්ෂේත්‍රයේ පළපුරුද්ද :—————.

(12) වෙනත් සුදුසුකම් :—————.

(13) ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය :—————.

(14) වෙනත් ආදළ විය හැකි තොරතුරු :————.

(15) අයදුම්කරු විසින් මීට පෙර කිසිදු අපරාධයක් සඳහා උසාවියේ පෙනී සිට ඇද්ද? :————.

එසේ පෙනී සිටින ලද්දේ නම් ඒ සම්බන්ධව විස්තර :————.

(16) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි V වැනි පරිච්ඡේදය අනුව රාජ්‍ය සේවයට පත් කරනු ලැබීමට සුදුසු තැනැත්තෙක් ද යන වග :————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගත හොත් මා තෝරා ගැනීමට නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැන ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(17) අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.

රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුර සඳහා අයදුම්පත්‍රය ඉදිරිපත් කරන …………………… නැමැති අය මා පෞද්ගලික වශයෙන් හඳුනන බවත්, 2013/2014 ………… මස ………… වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිට අත්සන් කළ බවත්, මෙයින් ප්‍රකාශ කරමි.

————,
අත්සන සහතික කරන අයගේ අත්සන.

දිනය :————.

ස්ථානය :————.

සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.

ලිපිනය :————.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය

රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුර සඳහා අයදුම් කරන මෙම ආයතනයේ ………………… තනතුර දරන …………………… මයා/මිය/මෙනවියගේ අයදුම් පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නැති බවත්, සහතික කරමි. ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක./නොහැක.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ
අත්සන
(නිල මුද්‍රාව)

දිනය :————.

12-338

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ (නීති) III වන පන්තියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2013

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ (නීති) III වන පන්තියේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ තරග විභාගය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම් පස උඩ කෙළවරේ ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ නීති තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. තව ද විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2014.01.13 දින වේ.

සටහන : ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතු ය.

1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

විවෘත තරග විභාගය සමත්වූවන්ගෙන් ඉහළම ලකුණු ලබා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට ලක් කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතු ය.

ii. මෙම තනතුරට පත්වීම ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර, සහකාර අධ්‍යක්ෂ තනතුරට පත්වී වසර තුනක් (03) ගතවීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

iii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 (II) අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර 05 ක් තුළදී ලබාගත යුතු ය. රාජ්‍ය භාෂාවකින් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් වසර 03 ක් එනම් පරිවාස කාලය තුළදී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය වසර හයක් (06) ඇතුළත ලබාගත යුතු ය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

v. තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත්කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට ඉඩ ඇත.

3. වැටුප් පරිමාණය :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2006 රු. 22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1,050 - රු. 53,555 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

4. අධ්‍යාපන /වෘත්තීය සුදුසුකම් :

*අධ්‍යාපන සුදුසුකම් :*
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙක් වීම/විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

*වෘත්තීය සුදුසුකම් :*

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දීමෙන් පසුව වසර තුනකට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්ද (විෂයයට අදාළව ලබා ඇති අමතර පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.)

5. වයස් සීමාව :
අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

6. කායික සුදුසුකම් :

i. සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,

ii. තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය. (තෝරා ගනු ලබන අපේක්ෂකයින් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කෙරෙනු ඇත.)

7. වෙනත් සුදුසුකම් :

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

iii. අයදුම්පත් කැඳවීමේ නිවේදනය පළ කරන දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

8.1 ලිඛිත විභාගය :

8.1.1 ලිඛිත විභාගය :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ඉංග්‍රීසි | පැය 02 | 100 | 40 |
| සාමාන්‍ය බුද්ධිය | පැය 01 | 100 | 40 |

8.1.2 විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ඉංග්‍රීසි | i. අවබෝධය :<br>මෙහි දී වචන 200 ට නොවැඩි තෝරාගත් ලිඛිත ඛණ්ඩයක් කියවා අවබෝධ කර පිළිතුරු සැපයීමේ හැකියාව පරීක්ෂා කෙරේ.<br>ii. ව්‍යාකරණ :<br>කාල නාම, ක්‍රියා, ඍජු සහ වක්‍ර කථනය, කර්මකාරක සහ කර්තෘ කාරක වාක්‍ය, ලිංග භේදය, නිපාත ආදී ක්ෂේත්‍රයන්හි සරල අවබෝධය පරීක්ෂා කෙරේ. |
| සාමාන්‍ය බුද්ධිය | පදගත සංඛ්‍යාත්මක සහ රූපාකාර සංදර්භයන් තුළ ඉදිරිපත් කෙරෙන ගැටළු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් සහ ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය සහ බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. |

විභාගය සඳහා පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත එක් එක් විෂය සඳහා ලබා ගත් ලකුණු, මුළු ලකුණු ඇතුළත් ප්‍රතිඵල ලේඛනයක් පෞද්ගලිකව ලබා දෙනු ඇත.

8.2 සම්මුඛ පරීක්ෂණය :

ඉහත එක් එක් ප්‍රශ්නපත්‍රය සඳහා ලකුණු 40%කට වඩා ලබා ගත් අයදුම්කරුවන්ගෙන් ඉහළම ලකුණු ලබා ඇති අයදුම්කරුවන් (පුරප්පාඩුවලට සමාන සංඛ්‍යාවක්) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින්, නිවේදනයේ සඳහන් සුදුසුකම් හා කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

9. විභාග කොන්දේසි :

i. විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පත්‍රයෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකු ම ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුතු ය.

ii. විභාග ගාස්තුව රු. 1000 කි. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ම ලබාගන්නා ලදුපතෙහි දාරයක් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙනසේ අලවන්න. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

iii. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

iv. මෙම විභාගය 2014 අප්‍රේල් මස පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

v. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සටහන : ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩදෙනු නොලැබේ. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම අදාළ ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින විට, එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

vi. ඉල්ලුම්පත්‍රය සෙ. මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු අතර, 1.0 සිට 5.0 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 6.0 සිට 11.0 වන තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද වන ලෙස සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩිදුරටත් දන්වමි. මේ සමග ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුව සකසන්න.

vii. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලබන අතර, සෑම ආකාරයකින්ම සම්පූර්ණ වූ ඉල්ලුම්පත් ඉදිරිපත් කරන ලද අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම පුවත්පත්වල නිවේදනයක් පළ කරනු ලැබේ. නිවේදනය පළවී දින 2 ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ද ලියාපදිංචි කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියද ළඟ තබාගෙන නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

viii. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

ix. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. අපේක්ෂකයාගේ අනන්‍යතාවය :

විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ. :-

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
iii. වලංගු රියදුරු බලපත්‍රය.

සැලකිය යුතුය :

(අ) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතු ය.

(ආ) ඉල්ලූ අවස්ථාවකදී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල, සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවෙකුම තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වේ. ආයතනයකින් විභාගයට පෙනී සිටින අයදුම්කරුවෙකු ඔහුගේ අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවා සහතික කරවා ගත යුතුය. එසේ නොවන අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසල් ප්‍රධානියකු/විශ්‍රාමික ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු, රු. 240,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

11. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12. මෙම රෙගුලාසිවල සළකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

13. පවතින පුරප්පාඩු සියල්ලක්ම හෝ ඉන් කොටසක් හෝ පිරවීමේ හෝ නොපිරවීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

අනුර සිරිවර්ධන,
ලේකම්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය.

2013 නොවැම්බර් මස 23 වැනි දින.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ (නීති) III වැනි පන්තියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2013

Open Competitive Examination for Recruitment to Class III of the Assistant Director (Legal) - 2013

ඉල්ලුම් පත්‍රය

මාධ්‍යය - විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය

සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

(මෙම නිවේදනයේ 9.1 වැනි ඡේදයට අනුව "මාධ්‍යය'' පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

1.0 1.1. මුල්'කුරු අගට යොදා මුල්'කුරු සමග නම :————.
(උදා : SILVA A. B.) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

13 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 උපන් දිනය : වර්ෂය මාසය දිනය :

3.2 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස :

අවු : මාස : දින :

4.0 ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ - 0, ස්ත්‍රී -1
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

5.0 ජන වර්ගය :

සිංහල -1 දෙමළ -2 මුස්ලිම් - 3 ඉන්දියානු දෙමළ - 4, වෙනත් - 5
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

6.0 විවාහක/අවිවාහක බව :
විවාහක -1, අවිවාහක - 2

7.0 උපාධිය පිළිබඳ විස්තර :
7.1 විශ්වවිද්‍යාලය/ආයතනය :————.
7.2 ලියාපදිංචි අංකය :————.
7.3 උපාධියේ නම :————.
7.4 උපාධිය පිරිනැමූ දිනය :————.
7.5 සාමාන්‍ය/විශේෂ :————.
7.6 පන්තිය :————.
7.7 ප්‍රධාන විෂයයන් :————.

8.0 අදාල වන වෙනත් අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් ඇත්නම් (පශ්චාත් උපාධි/ඩිප්ලෝමා/වෙනත් භාෂා ප්‍රවීණතාවයන් ආදිය) සඳහන් කරන්න. :————.

9.0 මුදල් ගෙවූ කුවිතාන්සිය මෙහි අලවන්න :
ලදුපත් අංකය :————.
මුදල් ගෙවූ දිනය :————.
මුදල් ගෙවූ කාර්යාලය :————.

(ලදුපත නොගැලවෙනසේ මෙහි අලවන්න)

10.0 අයදුම්කරුගේ/අයදුම්කාරියගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බව ප්‍රකාශ කරමි. තවද විභාග කොමසාරිස් ජනරාල්, විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි. මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

11.0 අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කිරීම (මෙම නිවේදනයේ 10 පරිදි විය යුතුය) : මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ……………………. (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, ..………… දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
නිල මුද්‍රාව :————.

**උසස් අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය

**උසස් තාක්‍ෂණ ආයතන සඳහා සිසුන් ඇතුළත් කිරීම - 2014 අධ්‍යයන වර්ෂය**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මගින් මෙහෙයවන උසස් ජාතික ඩිප්ලෝමා සඳහා 2012 වර්ෂයේ හෝ ඊට පෙර වර්ෂවල අ.පො.ස. (උ. පෙළ) සමත් අදාළ සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*අයැදුම්පත් :*

ආදර්ශ අයැදුම්පත පහත දක්වා ඇත. එම ආදර්ශ අයැදුම්පත්‍රයට අනුව සකස්කර ගන්නා ලද අයැදුම් පත්‍රයක් ඉංග්‍රීසියෙන් සම්පූර්ණ කර රු. 500 ක මුදලක් කොළඹ මහජන බැංකු උද්‍යාන වීදියේ ශාඛාවෙන් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් අංක 025-100133397613 දරන ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතන ජංගම ගිණුමට බැරකොට ලබාගන්නා ලද කුවිතාන්සිය අයදුම්පතේ අලවා ඔබගේ අයැදුම්පත 'ආ' කොටසේ සඳහන් ඔබ තෝරා ගත් පාඨමාලා පැවැත්වෙන උසස් තාක්‍ෂණ ආයතනයට හෝ උසස් තාක්‍ෂණ ආයතන අංශයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙලවරෙහි ඔබ විසින් අයැදුම් කරනු ලබන පාඨමාලාවේ නම සඳහන් කළ යුතුය. එක් ආයතනයකට වඩා අයැදුම් කරන්නේ නම් අයැදුම් කරනු ලබන සෑම අයැදුම් පත්‍රයක් සඳහාම වෙන වෙනම රු. 500 ක වටිනාකමකින් යුත් කුවිතාන්සි සමගින් අයැදුම්පත් ඉදිරිපත් කළ යුතුය. උක්ත අංක දරන ගිණුමට හැර වෙනත් ගිණුම්වලට බැරකරන ලද කුවිතාන්සි සහිත අයැදුම්පත් හා අසම්පූර්ණ අයැදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

අයැදුම්පත් භාරගන්නා අවසන් දිනට පසු ලැබෙන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

"ආ" කොටසෙහි ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයට අයත් උසස් තාක්‍ෂණ ආයතන/ආයතන අංශවල පවත්වනු ලබන පාඨමාලා හා ලිපිනයන් දක්වා ඇති අතර, අයැදුම්කරුවන් තම සුදුසුකම් හා සරිලන පාඨමාලා තෝරාගත යුත්තේ "අ" කොටසෙහි සඳහන් පාඨමාලා ලැයිස්තුව තුලිනි.

*දේශන පැවැත්වෙන ආකාරය :*

පූර්ණකාලීන පාඨමාලා සඳහා දේශන සතියේ දිනවල දිවා කාලයේ ද, අර්ධකාලීන පාඨමාලා සඳහා දේශන සති අන්තයේ දිවා කාලයේ ද පැවැත්වේ. සියළුම පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. අර්ධකාලීන පාඨමාලා අදාළ ක්ෂේත්‍රයේ රැකියාවන්හි නියුක්ත අයට පමණක් සීමා කෙරේ.

*පාඨමාලා ගාස්තු :*

පූර්ණ කාලීන පාඨමාලා සඳහා ගාස්තු අය කරනු නොලැබේ. අර්ධකාලීන පාඨමාලා සඳහා සමාසික ගාස්තු පහත පරිදි වේ.

| | |
|---|---|
| උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා - උ. ජා. ග. ඩි. | රු. 4,000 |
| උසස් ජාතික ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා - උ. ජා. ඉ. ඩි. | රු. 6,000 |
| උසස් ජාතික තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමා - උ. ජා. තො. තා. ඩි. | රු. 12,000 |

*සම්මුඛ පරීක්ෂණය :*

සුදුසුකම් අනුව තෝරාගත් අයදුම්කරුවන් අභියෝග්‍යතා පරීක්ෂණයකට හා/හෝ සම්මුඛ පරීක්‍ෂණයකට පෙනී සිටිය යුතු ය. ශිෂ්‍යයන් තෝරාගැනීම මූලිකව උසස් පෙළ විභාගයේ දී ලබාගත් ඒකාබද්ධ ලකුණු හෝ Z-score මත පදනම් වේ. සම්මුඛ පරීක්‍ෂණය සඳහා දිනය, වේලාව, ස්ථානය හා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන ආදී විස්තර අදාළ ආයතන ප්‍රධානීන් විසින් ලිපියකින් පෞද්ගලිකව දන්වා එවනු ඇත. අවශ්‍ය මුල් පිටපත් සම්මුඛ පරීක්‍ෂණයේදී ඉදිරිපත් කළ යුතුය. සහතිකවල මුල් පිටපත් නොමැති අවස්ථාවල දී සහතික කරන ලද ඡායාපිටපත්, ලියාපදිංචිවීමේ දී මුල් පිටපත් ඉදිරිපත් කරන කොන්දේසිය යටතේ භාරගනු ලැබේ.

*නේවාසික පහසුකම් :*

දෙහිවල හා නයිවල උසස් තාක්ෂණ ආයතනවල සීමිත කාන්තා නේවාසිකාගාර පහසුකම් සහ අම්පාර හාඩි උසස් තාක්ෂණ ආයතනයේ හා මට්ටක්කුලිය උසස් තාක්‍ෂණ ආයතනයන්හි සීමිත කාන්තා/පිරිමි නේවාසිකාගාර පහසුකම් ඇත. මෙම සීමිත පහසුකම් ලබාදෙනුයේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සුදුසුකම්ලත් සිසුන්හට පමණි.

එක් එක් පාඨමාලාවන් සඳහා ඇතුළත් වීමට අවශ්‍ය සුදුසුකම් :

**"අ" කොටස**

01. **උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (උ. ජා. ඉ. ඩි.) - සිවිල් (පූර්ණ කාලීන) - කාලය වසර 3 1/2යි.**

**උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (උ. ජා. ඉ. ඩි.) - විදුලි (පූර්ණ කාලීන) - කාලය වසර 3 1/2 යි.**

**උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (උ. ජා. ඉ. ඩි.) - යාන්ත්‍රික (පූර්ණ කාලීන) - කාලය වසර 3 1/2 යි**
**(සිවිල්/විදුලි/යාන්ත්‍රික ඉංජිනේරු)**

**උසස් ජාතික ගොඩනැගලි සේවා ඉංජිනෙරු ඩිපලෝමා (උ. ජා. ගො. සේ. ඉ. ඩි.) - (පූර්ණ කාලීන) - කාලය වසර 3 1/2 යි.**

**උසස් ජාතික ප්‍රමාණ හා මිනුම් සමීක්‍ෂණ ඩිප්ලෝමා (පූර්ණ කාලීන) (උ. ජා. ප්‍ර. මි. ස. ඩි.) - කාලය වසර 2 1/2 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-*

(i) අ. පො. ස. (උ/පෙළ) ගණිතය විෂය ධාරාව යටතේ විෂයයන් තුනම එක්වරකදී සමත්ව තිබීම (2010/2011/2012);

*සහ*

අ. පො. ස. (සා/පෙළ) ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

02. **උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා - උ. ජා. ග. ඩි (පූර්ණ කාලීන) - කාලය වසර 4 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතු ය. :-*

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය (නව නිර්දේශය) යටතේ ව්‍යාපාර සංඛ්‍යානය හෝ සංයුක්ත ගණිතය හෝ ගිණුම්කරණය විෂයය ඇතුළත්ව විෂයයන් තුනම එක්වරක දී සාමාර්ථය ලබා තිබීම, මෙම විෂයයන් තුනෙන් විෂයයන් දෙකකට සම්මාන ලබා තිබිය යුතු ය.

අ. පො. ස. (උ./පෙළ) විභාගයේ දී ව්‍යාපාර සංඛ්‍යානය හෝ සංයුක්ත ගණිතය හෝ ගිණුම්කරණය විෂයයන්ට සම්මාන සාමාර්ථයක් ලබා නැත්නම් අ. පො. ස. (සා. පෙ.) විභාගයේ දී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.;

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීය ජාතික සහතිකය සමත්වීම;

*සහ*

අ. පො. ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.

**2. 1 උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා - උ. ජා. ග. ඩි (අර්ධ කාලීන) - කාලය වසර 4 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතුය. :*

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය (පැරණි නිර්දේශය) යටතේ එක් අවස්ථාවක දී විෂයයන් හතරකින් හෝ (නව නිර්දේශය) යටතේ එක් අවස්ථාවක දී විෂයයන් තුනකින් සමත් වී තිබීම;

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීය ජාතික සහතිකය සමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

(iii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය (ගණකාධිකරණය) සාමාර්ථයක් ලබා තිබීම හෝ ගණකාධිකරණය පිළිබඳ ජාතික සහතිකය සාමාර්ථයක් ලබා තිබීම;

*සහ*

*ප්‍රායෝගික පළපුරුද්ද* - අයදුම්කරු රජයේ, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නිරතව සිටින අයකු විය යුතු ය.

පහත සඳහන් සුදුසුකම් දරන්නන් උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාවේ ප්‍රථම වසරින් නිදහස් කර එහි II වසරට බඳවා ගැනීම සෙසු අවශ්‍යතාවන් සපුරාලීමේ හා ඉඩකඩ තිබීමේ කොන්දේසියට යටත්ව අනුමත කර ඇත.

(i) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය මගින් හෝ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ව්‍යාපාර අධ්‍යයන පිළිබඳ ජාතික ඩිප්ලෝමාව/ව්‍යාපාර මූල්‍ය සමත්ව තිබීම;

(ii) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය මගින් පවත්වනු ලබන උසස් ජාතික ව්‍යාපාර පරිපාලනය/ව්‍යාපාර මූල්‍ය/කළමනාකරණ ඩිප්ලෝමාව සමත්ව තිබීම;

(iii) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය මගින් හෝ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන උසස් ජාතික වාණිජ ඩිප්ලෝමාවේ දෙවන වසර සමත්ව තිබීම;

(iv) අදාළ ක්ෂේත්‍රයේ විශ්වවිද්‍යාල උපාධිය (ගණකාධිකරණ/ ව්‍යාපාර පරිපාලන/අලෙවි කළමනාකරණ/ මානව සම්පත් කළමනාකරණ/ ව්‍යාපාර මූල්‍ය/ව්‍යාපාර ආර්ථික විද්‍යා);

(v) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ මාධ්‍ය පරීක්ෂණය සමත්ව තිබීම;

(vi) වරලත් කළමනාකාරිත්ව ගණකාධිකරණ ආයතනයේ I සහ II පරීක්ෂණය සමත්ව තිබීම;

(vii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීය ආයතනයේ III අදියර පරීක්ෂණය සමත්ව තිබීම;

(viii) සහතිකලත් කළමණාකරන ගණකාධිකාරී ආයතනයේ අවසාන විභාගය සමත්ව තිබීම.

**03. උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා - උ. ජා. ක. ඩි (පූර්ණ කාලීන) - කාලය වසර 3 යි.**

**සහ**

**උසස් ජාතික සංචාරක හා සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමා - උ. ජා. ස. ස. ක. ඩි. (පූර්ණ කාලීන) - කාලය වසර 3 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතුය. :-*

(i) ඕනෑම විෂයය ධාරාවකින් අ. පො. ස. (උ/පෙළ) විභාගය එක් වරක දී සියලුම විෂයයන්ගෙන් සමත්වීම;
(ගණිතය, ජීවවිද්‍යාව සහ වාණිජ්‍යය යන විෂයය ධාරාවන් යටතේ නම් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.)

*සහ*

අ. පො. ස. (සා/පෙළ) විභාගයේ දී ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව විෂයයන්ට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතික පත්‍රය

හෝ රාජ්‍ය පරිපාලනය හෝ අලෙවිකරණය සඳහා වූ ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය සමත්වීම;

*සහ*

අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාර්ථයක් ලබා තිබීම.

**04. උසස් ජාතික ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා - උ. ජා. ව්‍යා. ප. ඩි. (පූර්ණ කාලීන) — කාලය වසර 2 1/2 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතුය. :-*

(i) අ. පො. ස. (උ/පෙළ විභාගය වාණිජ්‍යය විෂය ධාරාවෙන් එක්වරකදී සමත් වීම.

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතිකය සමාර්ථයක් ලබා තිබීම;

*සහ*

(iii) අ. පො. ස. (සා./පෙ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සමාර්ථයක් ලබා තිබීම.

**05. උසස් ජාතික තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමා - උ. ජා. තො. තා. ඩි. (පූර්ණ කාලීන - කාලය වසර 2 1/2යි) අර්ධ කාලීන - කාලය වසර 2 1/2යි)**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතු ය.* :-

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් එක් වරකදී සමත්ව තිබීම.
(ගණිතය, ජීව විද්‍යාව සහ වාණිජ්‍යය යන විෂය ධාරාවන් යටතේ නම් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.);

*සහ*

අ.පො.ස. (සා.පෙළ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

*සහ*

*සැලකිය යුතුයි* :-

(අර්ධ කාලීන සිසුන් සඳහා පමණක්), තොරතුරු තාක්‍ෂණ ක්‍ෂේත්‍රය සම්බන්ධ රැකියාවක නිරත විය යුතුය.

**06. උසස් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා (කෘෂිකර්මය) - උ. ජා. තා. ඩි. (කෘෂි) (පූර්ණ කාලීන) - කාලය වසර 3 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතු ය* :-

(i) අ.පො.ස. (උ./පෙළ.) විභාගය (පැරණි නිර්දේශය) යටතේ ජීව විද්‍යා අංශයෙන්, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, උද්භිද විද්‍යාව, භෞතික විද්‍යාව, හා සත්ත්ව විද්‍යාව යන විෂයයන් අතරින් දෙකක් සහිතව විෂයයන් හතරකින් එකවර සමත්වී තිබීම;

*හෝ*

(ii) එක් වතාවක දී අ.පො.ස. (උ./පෙළ.) විභාගය (නව නිර්දේශය) යටතේ ජීව විද්‍යා අංශයෙන්, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් දෙකක් සහිතව විෂයයන් තුනකින් සමත්වී තිබීම;

*සහ*

(iii) අ.පො.ස. (සා./පෙළ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂා විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**07. උසස් ජාතික ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා - උ. ජා. ඉ. ඩි. (පූර්ණ කාලීන - කාලය වසර 2 1/2/අර්ධ කාලීන - කාලය වසර 2 යි.)**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතුය. :-

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය ඕනෑම විෂයය ධාරාවකින් එක්වරකදී සමත්ව වී තිබීම සහ අ. පො. ස. (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි සාහිත්‍ය හෝ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ "C" සාමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

(ii) ඉංග්‍රීසි (විශේෂ) ගුරු පුහුණු සහතිකය හෝ විද්‍යා පීඨ ඩිප්ලෝමා සහතිකය (ඉංග්‍රීසි);

*හෝ*

(iii) අ. පො. ස. (උ/පෙළ) විභාගය නව විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනම සමත්වීම සහ අ. පො. ස. (උ/පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

*හෝ*

(iv) අ. පො. ස. (උ/පෙළ) විභාගය සමත්ව තිබීම සහ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාණිජ කර්මාන්ත සහ වැඩිදුර අධ්‍යාපන සඳහා වන ඉංග්‍රීසි පිළිබඳ ජාතික සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය ලබා තිබීම හෝ සමාන සුදුසුකම් ලබා තිබීම.

(සැ. යු.—අර්ධ කාලීන අයදුම්කරුවන් අදාල ක්ෂේත්‍රය සම්බන්ධ රැකියාවක නිරත විය යුතුය.)

**08. උසස් ජාතික ව්‍යාපාර මූල්‍ය ඩිප්ලෝමා- උ. ජා. ව. මූ. ඩි - (පූර්ණ කාලීන) - කාලය වසර 2 1/2 යි**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතුය* :-

(i) අ.පො.ස. (උ.පෙළ) විභාගය (පැරණි නිර්දේශය) යටතේ ආර්ථික විද්‍යාව, වාණිජ හා මුල්‍ය, ගණකාධිකරණය ඇතුළු විෂයයන් හතරකින් එක් වරක දී සමත් වී තිබීම;

හෝ

(ii) අ. පො. ස. (උ. පෙළ.) විභාගය (නව නිර්දේශය) යටතේ ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාර අධ්‍යයනය සහ ගිණුම්කරණය යන විෂයයන් තුනෙන් සාමාර්ථය හෝ ඉහත විෂයයන් දෙකක් සහ භුගෝල විද්‍යාව, ගෘහ ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය, කෘෂි විද්‍යාව හෝ සංයුක්ත ගණිතය යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව එක්වරක දී විෂයයන් තුනකින් සමත්ව තිබීම;

හෝ

(iii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පවත්වන ගණකාධිකරණ ජාතික සහතික පත්‍ර විභාගය සමත් වී තිබීම.

සහ

(iv) අ.පො.ස. (සා.පෙළ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**09. උසස් ජාතික ආහාර තාක්‍ෂණ ඩිප්ලෝමා - උ. ජා. ආ. තා. තා. ඩි. (පූර්ණ කාලීන) - කාලය වසර 2 1/2**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-

(i) අ.පො.ස. (උ.පෙළ) විභාගය ජීව විද්‍යාව හෝ භෞතික විද්‍යාව විෂයය ධාරාවන් යටතේ විෂයයන් තුනම එක් වරක දී සමත් ව තිබිය යුතුය;

සහ

අ. පො. ස. (සා. පෙළ.) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය විෂය සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

*"ආ" කොටස*

*උසස් තාක්ෂණ ආයතන/උසස් තාක්ෂණ ආයතන අංශ, ලිපිනයන්, දුරකථන අංක හා පවත්වන පාඨමාලා :*

| සංකේත අංකය | ආයතන/ආයතන අංශය | ලිපිනයන් | දුරකථන අංක | පවත්වන පාඨමාලාවන් |
|---|---|---|---|---|
| 01 | හාඩි උසස් තාක්‍ෂණ ආයතනය, අම්පාර | ඉඟිනියාගල පාර, අම්පාර | 063-2222056<br>063-2223035 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ක. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තා. ඩි. (කෘෂි), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) |
| 02 | උසස් තාක්‍ෂණ, ආයතන අංශය, අනුරාධපුරය | අංක 388/35 හරිස්චන්ද්‍ර මාවත අනුරාධපුරය | 025-2234417 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), |
| 03 | උසස් තාක්‍ෂණ ආයතනය, බදුල්ල | ග්‍රීන්ලන්ඩ් ඩ්‍රයිව්, බදුල්ල | 055-2230218<br>055-2223818 | උ. ජා. ග. ඩි. (පූ. කා), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි, උ. ජා. ව්‍යා. ප. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) උ. ජා. ස. ස. ක. ඩි. |
| 04 | උසස් තාක්‍ෂණ ආයතන අංශය, මඩකලපුව | මල්ටි පර්පස් ගොඩනැගිල්ල, කෝවිල් කුලම් නැගෙනහිර, අරයාම්පති | 065-2247519 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි. ඩි. (අ. කා.), |
| 05 | උසස් තාක්‍ෂණ ආයතනය, දෙහිවල | වෛද්‍ය පාර, දෙහිවල | 011-2714270<br>011-2738349 | උ. ජා. ග. ඩි (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ක. ඩි., උ. ජා. ව්‍යා. ප. ඩි. උ. ජා. තො. තා. ඩි. (පූ. කා), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. ව්‍යා. මු. ඩි. උ. ජා. ස. ස. ක. ඩි. |

| සංකේත අංකය | ආයතන/ආයතන අංශය | ලිපිනයන් | දුරකථන අංක | පවත්වන පාඨමාලාවන් |
|---|---|---|---|---|
| 06 | උසස් තාක්‍ෂණ ආයතනය, යාපනය | අංක 665/5 වෙරළ පාර, යාපනය | 021-2222595<br>021-2239803 | උ. ජා. ඉ. ඩි., උ. ජා. ග. ඩි. (පූ. කා), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි. උ. ජා. ව්‍යා. ප. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (අ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා.ඉංග්‍රීසි ඩි (අ. කා.) උ. ජා. ස. ස. ක. ඩි. |
| 07 | උසස් තාක්‍ෂණ ආයතනය, මහනුවර | අංක 16, කැප්පෙටිපොල පාර, මහනුවර | 081-2226644<br>081-2232097 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි. උ.ජා. ව්‍යා. ප. ඩි, උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), (අ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි, (අ. කා.) උ. ජ. ස. ස. ක.ඩි |
| 08 | කෑගල්ල උසස් තාක්‍ෂණ ආයතනය, කෑගල්ල | බංඩාරනායක මාවත, කෑගල්ල | 035-2221297<br>035-2221713 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) |
| 09 | උසස් තාක්‍ෂණ ආයතනය, කුරුණෑගල | අංක 22/1, විල්ගොඩ පාර, කුරුණෑගල | 037-2224911<br>037-2229583 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා,), උ. ජා. ක. ඩි. උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), |
| 10 | ගාල්ල උසස් තාක්‍ෂණ ආයතනය, ලබුදූව | සිරිධම්ම මාවත, ලබුදූව, අක්මීමන | 091-2227880<br>091-2246179 | උ. ජා. ඉ. ඩි, උ. ජා. ග. ඩි. (පූ. කා), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි., උ. ජා. ව්‍යා. ප. ඩි, උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි (අ. කා), උ. ජා. තා. ඩි. (කෘෂි), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. ප්‍ර. මි. ස. ඩි. උ. ජා. ගො. සේ. ඉ. ඩි. උ. ජා. ස. ස. ක. ඩි. |
| 11 | උසස් තාක්‍ෂණ ආයතනය, මට්ටක්කුලිය | අංක 42, රොදිගු පෙදෙස, කොළඹ 15. | 011-2529479<br>011-2521152 | උ. ජා. ඉ. ඩි., උ. ජා. ප්‍ර. මි. ස. ඩි., උ. ජා. ගො. සේ. ඉ.ඩි. |
| 12 | උසස් තාක්‍ෂණ ආයතනය, නයිවල | නයිවල, එස්සැල්ල, වේයන්ගොඩ | 033-2287519<br>033-2292544 | උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (අ.කා.), උ. ජා. තා. ඩි. (කෘෂි) උ. ජා. ආ. තා. ඩි |
| 13 | උසස් තාක්‍ෂණ ආයතනය, රත්නපුරය | නව නගරය, රත්නපුරය | 045-2230780 | උ. ජා. ග. ඩි (අ. කා), උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) |
| 14 | උසස් තාක්‍ෂණ ආයතනය අංශය, සමන්තුරේ | මහ වීදිය, සමන්තුරේ | 067-2261304 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) |
| 15 | උසස් තාක්‍ෂණ ආයතනය තංගල්ල | යායවත්ත, නෙටොල්පිටිය, තංගල්ල | 091-2246179 | උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ග. ඩි. (පූ. කා) උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) |
| 16 | උසස් තාක්‍ෂණ ආයතනය, ත්‍රිකුණාමලය | කන්නියා පාර, වරෝධය නගර්, ත්‍රිකුණාමලය | 026-3262937 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි. ඩි. (අ. කා.) |
| 17 | උසස් තාක්‍ෂණ ආයතනය, වවුනියාව | "ජනවතු පියස" අංක 320, ටී. බී. ජයා මාවත කොළඹ 10. | 011-2691307 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) |

සැලකිය යුතුයි :

(1) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා, උසස් ජාතික ප්‍රමාණ හා මිනුම් සමීක්ෂණ ඩිප්ලෝමා, උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු ඩිප්ලෝමා (පූර්ණ කාලීන) පාඨමාලාවන් සඳහා අයදුම්කරුවන් සතියේ දිනයන්හි පාඨමාලාවන් සඳහා සහභාගි වීමට නිදහස් විය යුතු අතර, සති අන්තයේදී ද අවශ්‍යතා අනුව පාඨමාලා කටයුතුවලට සහභාගි වීමට හැකි විය යුතුය.

(2) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (පූර්ණකාලීන) පාඨමාලාවේ පළමු සහ දෙවන වසර සතියේ දිනවල දිවා කාලයේ ද, තෙවන, සිව්වන වසර සති අන්තයේ ද පවත්වනු ඇත.

(3) උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාවේ (පූර්ණකාලීන) දේශන පළමු හා දෙවන වසර සතියේ දිනවල දිවා කාලයේදී ද, තෙවන වසර සඳහා සති අන්තයේ දී පවත්වනු ඇත.

(4) අ.පො.ස. (උ.පෙ.) නව නිර්දේශය යටතේ අයදුම්කරන්නන් සාමාන්‍ය පොදු පරීක්ෂණය සමත්ව තිබීම අනිවාර්ය වේ.

(5) ඒ ඒ පාඨමාලාවන්ට තෝරා ගැනීමේ දී අ.පො.ස. (උ.පෙ.) ඒකාබද්ධ ලකුණු හෝ Z-Score සැලකිල්ලට ගනු ලැබේ.

(6) සුදුසුකම් ලද විභාගයේ දී පාඨමාලාවට අදාළ විෂයයන්ගෙන්/විෂයය ක්ෂේත්‍රයේ සාමාර්ථයක් ලත් අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(7) පූර්ණකාලීන පාඨමාලාව සඳහා වයස අවු. 23ට අඩු අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(8) අදාල උසස් තාක්ෂණ ආයතනයක හෝ උසස් තාක්ෂණ ආයතන අංශයක පාඨමාලාවක් පැවැත්වීම සඳහා අවම වශයෙන් අයදුම්කරුවන් 25ක් සිටිය යුතු ම වේ.

(9) අදාල උසස් තාක්ෂණ ආයතනයක හෝ ආයතන අංශයක පැවැත්වෙන පාඨමාලාවක් සඳහා නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව ඉක්මවා යන අයදුම්පත් ප්‍රමාණයක් වේ නම්, එම ආයතනය විසින් පවත්වන යෝග්‍යතා විභාගයක් මගින් නියමිත ශිෂ්‍ය සංඛ්‍යා බඳවා ගනු ලැබේ.

(10) කුමන හේතුවක් නිසා හෝ තෝරා ගැනීමෙන් පසු පූර්ණ කාලීන සිසුන් අදාල පාඨමාලාව හැදෑරීම සඳහා වෙනත් උසස් තාක්ෂණ ආයතනයකට හෝ ආයතනය අංශයකට මාරු කරනු නොලැබේ.

(11) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අවුරුදු 03ක් හෝ ඊට වැඩි කාලයක පාඨමාලාවකට ලියාපදිංචි වන ශිෂ්‍යයෙකුට විශ්ව විද්‍යාල ප්‍රවේශයට අයදුම් කිරීමට හැකිවන පරිදි තම ලියාපදිංචිය, ලියාපදිංචි වීමට අදාල ආයතනය විසින් දී ඇති අවසාන දින සිට දින 60ක කාලයක් ඇතුළත අවලංගු කිරීමට ඉඩ ලබාදිය හැකිය.

සටහන :

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට 2014 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය වේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2013.12.31 වේ.

ඩබ්ලිව්. හිලරි ඊ. සිල්වා,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය.

අංක 320, ජනවතු පියස,
ටී. බී. ජයා මාවත, කොළඹ 10.
Web site : www.sliate.a.c.lk

*Office use only* – Course Number :..........................................

*Specimen Application Form*

**SRI LANKA INSTITUTE OF ADVANCED TECHNOLOGICAL EDUCATION**

***APPLICATION FORM FOR ADMISSION TO HIGHER NATIONAL DIPLOMA COURSES IN 2014***

| *Name of the Course* | *Order of Preference* |
|---|---|
| 1. ............................ | .......................................... |
| 2. ............................ | .......................................... |
| 3. ............................ | .......................................... |

1. Name with initials :————.

2. Name/Names denoted by Initials :————.

3. Address :————.

4. Date of Birth :
   Year :————., Month :————., Date :————.

   Age (as at 31.12.2013) :

   Years :————., Months :————., Days :————.

5. National Identity Card No. :————.

6. Sex : ————.

7. Administrative District :————. Contact Phone Number :————.

8. (i) Results of GCE (A/L) Examination (on or before 2012)

   Year :————, Index No. :————. Medium :————.

| *Subjects* | *Grade* |
|---|---|
| 1. ..................................... | ..................................... |
| 2. ..................................... | ..................................... |
| 3. ..................................... | ..................................... |
| 4. ..................................... | ..................................... |

   If under new syllabus indicate pass or fail in the common general paper :————.

   Aggregate/Z-score of the above examination :————.

(ii) Results of GCE (O/L) Examination :————.

Year :————. Index No.:————. Medium :————.

| *Subject* | *Grade* | *Subject* | *Grade* |
|---|---|---|---|
| 1. .................................... | .................................... | 6. .................................... | .................................... |
| 2. .................................... | .................................... | 7. .................................... | .................................... |
| 3. .................................... | .................................... | 8. .................................... | .................................... |
| 4. .................................... | .................................... | 9. .................................... | .................................... |
| 5. .................................... | .................................... | 10. .................................... | .................................... |

9. Highest Qualification in English as a subject :————.

10. Only for part-time Courses
Details of Present Employment : Date of Appointment :————.

Post :————.
E. P. F. Number :————.
Place of Work and Address :————.

I hereby declare that I am not following any other full-time course of study in any other state institution. I am aware that my registration will be cancelled at any time during the period of study if it is found that, I concurrently follow a full-time course at any other state institution. I hereby certify that the information furnished here is true and accurate to the best of my knowledge.

————,
Signature of Applicant.

Date :————.

(The bank receipt for Rs. 500 payable to SLIATE should be annexed.)

12-530

---

**ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය සහ දෙවන භාෂාව පිළිබඳ පරීක්‍ෂණය - 2013 (II)**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය - 2013 (II)

ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණය, ශ්‍රී ලකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය යන පරීක්‍ෂණ, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අධීක්ෂණය සහ මෙහෙයවීම යටතේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ විසින් 2014 ජනවාරි මස 18 වැනි දින සිට 2014 පෙබරවාරි මස 02 වැනි දින දක්වා සති අන්ත දිනවල දී කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. ඉහත සේවාවන්ට අදාළව පැවැත්වීමට නියමිත කාර්යක්‍ෂමතා කඩඉම් විභාග සහ දෙවන භාෂාව පිළිබඳ පරීක්‍ෂණ පහත සඳහන් පරිදි වේ.

| *අනු. අංකය* | *විභාගයේ නම* | *සංකේත නාමය* |
|---|---|---|
| 01. | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙවන භාෂා පරීක්‍ෂණය | SLAS 1 |
| 02. | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙවන භාෂා පරීක්‍ෂණය | SLES |

| අනු. අංකය | විභාගයේ නම | සංකේත නාමය |
|---|---|---|
| 03. | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙවන භාෂා පරීක්ෂණය | SLSS |
| 04. | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙවන භාෂා පරීක්ෂණය | SLArS |
| 05. | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLAS 2 |

03. තමා කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිවේ. එතෙකුදු වුවත් නියම කර ඇති කාලසීමාව තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීම අත්‍යාවශ්‍ය වේ.

04. මෙම විභාගය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. මෙම නීති උල්ලංඝනය කළහොත් විනය බලධරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවෙනවා ඇත.

05. මෙම විභාගය සඳහා අයදුම් කිරීම අන්තර්ජාලය හරහා මාර්ගගත ක්‍රමයට (Online) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිල වෙබ් අඩවිය වන www.slida.lk වෙත පිවිසීමෙන් පමණක් කළ හැක. www.slida.lk වෙබ් අඩවියේ මෙනු පටිත්තෙන් Examination උප මෙනුව විවෘත කර තමන්ට අදාළ විභාගය තෝරා ගැනීමෙන් විභාග අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට ඇරඹිය හැක. විභාග අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම 2013.12.13 දින පෙ. ව. 8.00 සිට 2014.01.03 දින රාත්‍රී 12.00 දක්වා වන කාලය තුළ පමණක් සිදු කළ හැක.

06. *විභාග ගාස්තු* - පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ.

මීට පෙර විභාගයට පෙනී සිටි නිලධාරීන් පහත පරිදි විභාග ගාස්තු ගෙවිය යුතු වේ.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙවන භාෂා පරීක්ෂණය එක් විභාගයක් ලෙසත්, දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය තවත් විභාගයක් ලෙසත් සලකා විභාග ගාස්තු ගෙවිය යුතු ය. ඒ අනුව පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ හා දෙවන භාෂා පරීක්ෂණයේ එක් විෂයයකට වඩා අයදුම් කරන්නේ නම් රු. 1,000 ක විභාග ගාස්තුවක් ද, දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ එක් විෂයයකට වඩා පෙනී සිටින්නේ නම් රු. 1,000 ක් ද විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතු ය. පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ එක් විෂයයකට පමණක් පෙනී සිටින්නේ නම් රු. 500 ක විභාග ගාස්තුවක් ද, දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ එක් විෂයයකට පමණක් පෙනී සිටින අයදුම්කරුවන් රු. 500 ක විභාග ගාස්තුවක් ද ගෙවිය යුතු වේ.

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා විද්‍යාත්මක හා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධාරීන් පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ එක් විෂයයකට වඩා අයදුම් කරන්නේ නම් රු. 1,000 ක් විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතු ය. එක් විෂයයකට පමණක් පෙනී සිටින්නේ නම් රු. 500 ක විභාග ගාස්තුවක් ගෙවිය යුතු ය.

විභාග ගාස්තු ශ්‍රී ලංකාව පුරා පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් මගින් (උප තැපැල් කාර්යාල හැර) "SLIDA " ගිණුම වෙත ගෙවිය යුතු අතර ඒ ගෙවීමට අදාළව ලබාදෙන රිසිට් පතේ අංකය විභාග අයදුම්පතේ අදාළ ස්ථානයන්හි ඇතුළත් කළ යුතු ය. අදාළ තැපැල් කාර්යාලයේ දී " SLIDA" ගිණුම වෙත මුදල් ගෙවීමේ මෙරට විදුලි මුදල් ඇණවුම් ඉල්ලුම් පත්‍රය (තැ. කා. සි. 85) පිරවීමේ දී මුදල් ලබා ගන්නා ලෙස " SLIDA" යන්න ද, මුදල් ලබන්නාගේ ලිපිනය යන ස්ථානයේ ඔබට අදාළ විභාගයේ සංකේත නාමය ද සටහන් කරන්න. (සංකේත නාමයන් 02 වගන්තියේ දක්වා ඇති පරිදි විය යුතු ය.)

තව ද, ගිණුම වෙත මුදල් ගෙවීමේ දී මුදල් යවන්නා ලෙස අයදුම්කරුගේ නම ද, මුදල් යවන්නාගේ ලිපිනය යන ස්ථානයේ අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය ද, ඇතුළත් කර ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ යුතු ය.

07. Online ක්‍රමයට සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර Submit කළ පසු අදාළ අයදුම්කරු වෙත තහවුරු කිරීමේ අංකයක් (Confirmation Number) ලබා දෙනු ලබන අතර, එය ඉදිරි විමසීම් කටයුතු සඳහා අයදුම්කරු වෙත තබාගත යුතුවේ. අයදුම්කරුවන් විසින් නිසි ලෙස සම්පූර්ණ කළ අයදුම්පත්‍රය මාර්ගගතව (Online) යොමු කිරීමෙන් අනතුරුව ලැබෙන වෙබ් පිටුවේ ඇති උපදෙස් අනුගමනය කිරීමෙන් තමාට හිමි විභාග ප්‍රවේශ පත්‍රය ලබා ගැනීමට ඉඩ සැලසෙනු ඇත. එම ප්‍රවේශ පත්‍රය මුද්‍රණය කර දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු/ඇය විසින් ස්වකීය බලය පැවරූ නියෝජ්‍ය නිලධාරියකු වෙතින් තම අත්සන සහතික කරගත යුතුවේ. එසේ සහතික කරගත් විභාග ප්‍රවේශ පත්‍ර විභාගශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

08. අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් යම් ගැටලුවක් මතු වුවහොත් ඒ පිළිබඳ විමසීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 011-5980236 යන දුරකථන අංකය 2013.12.13 දින සිට 2014.01.03 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ. ව. 08.30 සිට ප. ව. 4.30 දක්වා විවෘතව ඇත.

09. විභාග ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු දිය යුතු ය. අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය තහවුරු කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011-5980236 ඔස්සේ ඒ බව තහවුරු කර ගත හැකි ය. විභාගයට පැමිණීම වෙනුවෙන් ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

10. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.-* අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් ම පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂකගේ අභිමතය පරිදි අවලංගු කළ හැකි ය.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර යම් අපේක්ෂකයකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටි බැව් පසුව හෙළි වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. *විභාග පරිපාටිය.-*එක් එක් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන විෂයයන් සහ විෂයය නිර්දේශයන් පහත සඳහන් පරිදි වේ.

12.1 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙවන භාෂා පරීක්ෂණය (2005.11.14 දිනැති අංක 1419/3 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 'ඈ' පරිශිෂ්ඨය)

මෙම විභාගය සඳහාවන විෂයයන් පහත දැක්වේ :

| *අනු. අංකය* | *විෂයය* | *කාලය* | *විෂයය අංකය* |
|---|---|---|---|
| 01. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය | පැය 03 යි | 01 |
| 02. | ශ්‍රී ලංකාවේ නීති ක්‍රම | පැය 03 යි | 02 |
| 03. | අපරාධ නීතිය හා සාක්ෂ්‍ය නීතිය | පැය 03 යි | 03 |
| 04. | පරිපාලනය | පැය 03 යි | 04 |
| 05. | ආර්ථික විද්‍යාව | පැය 03 යි | 05 |
| 06. | සමාජ විද්‍යාව | පැය 03 යි | 06 |
| 07. | ඉංග්‍රීසි | පැය 03 යි | 07 |

12.1.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය (විෂයය අංකය 01)
*පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි*
(i) ඓතිහාසික සංවර්ධනය ද ඇතුලුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යුහය හා දෙවන ජනරජ ව්‍යවස්ථාව,
(ii) විධායකය, ජනරජයේ ජනාධිපති, අමාත්‍ය මණ්ඩලය හා අගමැති, මධ්‍යම රජයේ දෙපාර්තමේන්තු හා රාජ්‍ය සේවය,
(iii) යුක්තිය පසිඳලීම,
(iv) පරිපාලනය සම්බන්ධ අධිකරණ පාලනය,
(v) රාජ්‍ය ප්‍රතිපත්තිය උදෙසා මාර්ගෝපදේශ ප්‍රතිපත්ති සහ මූලික යුතුකම්,
(vi) අභිනියෝජන ව්‍යවස්ථා,
(vii) රජයේ හා රාජ්‍ය අධිකාරීන් හි වගකීම්,
(viii) මූලික අයිතිවාසිකම්.

12.1.2 ශ්‍රී ලංකාවේ නීති ක්‍රම (විෂයය අංකය 02)
පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි.
(i) ශ්‍රී ලංකාවේ නීති ඉතිහාසය,
(ii) අධිකරණ සංවිධානය,
(iii) ශ්‍රී ලංකාවේ උසාවි ආඥාපනත (6 පරිච්ඡේදය),
(iv) 1971 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත.

12.1.3 අපරාධ නීතිය හා සාක්ෂ්‍ය නීතිය (විෂයය අංකය 03)
පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි.
(i) දණ්ඩ නීති සංග්‍රහය,
(ii) සාක්ෂ්‍ය ආඥාපනත.

*සටහන.-*අපේක්ෂකයකු ඉහත 12.1.1, 12.1.2 සහ 12.1.3 හි සඳහන් එක් එක් විෂයය සඳහා අවම වශයෙන් 35%ක ලකුණු ප්‍රමාණයක් සහ විෂයයන් 03හි මුළු ලකුණු වලින් 40%ක සාමාන්‍යයක් ලබා ගත යුතු වේ.

12.1.4 පරිපාලනය (විෂයය අංකය 04)
*පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි*
(i) කාර්යාල සහ ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කිරීම හා සංවිධාන ක්‍රම,

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009.02.20 දිනැති සහ 1589/30 අංක දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද කාර්ය පටිපාටික රීති සහ ආයතන සංග්‍රහයේ පහත දැක්වෙන පරිච්ඡේද VI, VII, IX, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII සහ XLVIII.

*සටහන.-* මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

12.1.5 ආර්ථික විද්‍යාව (විෂය අංකය 05)/ සමාජ විද්‍යාව (විෂය අංකය 06)
අපේක්ෂකයන් ආර්ථික විද්‍යා හෝ සමාජ විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයකට පමණක් පෙනී සිටිය යුතුය.

12.1.5.1 ආර්ථික විද්‍යාව (විෂය අංකය 05) :
*පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි :-*

(i) වටිනාකම, නිෂ්පාදනය හා බෙදා හැරීමේ න්‍යායන් පිළිබඳ විශේෂ අවධානයක් සහිතව ආර්ථික විද්‍යාවේ මූලධර්ම,
(ii) මුදල්, මූල්‍ය කටයුතු හා මුදල් න්‍යාය,
(iii) ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය.

*සටහන.-* මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

12.1.5.2 සමාජ විද්‍යාව (විෂය අංකය 06) :

ශ්‍රී ලංකාව පිළිබඳ විශේෂ අවධානය සහිතව පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි. :-

(i) සමාජ ව්‍යුහය, සංවිධානය හා කාර්යයන්,
(ii) මානව සම්බන්ධතා හා කණ්ඩායම්,
(iii) බන්ධුත්වය, විවාහය හා පවුල,
(iv) ග්‍රාමීය හා නාගරික සමාජය,
(v) සමාජ ස්ථරායනය හා විභේදනය,
(vi) සමාජයීය පාලනය,
(vii) සංස්කෘතිය, ආගම, සදාචාරය හා හර පද්ධතීන්.

*සටහන :* මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

12.1.6 ඉංග්‍රීසි (විෂය අංකය 07) :

මෙම විෂයය සඳහා අදාළ විෂය නිර්දේශය පහත පරිදි වේ.

(i) Listening and Speaking Skills.—The candidate should possess the ability to function effectively in the following language functions.
* General Greetings and Introductions,
* Giving and Getting Information,
* Advising, Suggesting and Expressing Opinions,
* Describing Events and Situations,
* Telephone Skills,
* Interviewing Skills,
* Meeting,
* Listening and Note Talking skills.

(ii) *English Grammer.*—A suitable level of proficiency on the following forms of grammar in the Spoken the Written Language is expected from the candidate
* Tense and Numbers,
* Sentences (Simple/Compound/Complex/Compound Complex),
* Relative Clauses,
* Reported Speech,
* Adjectives and Adverbs,
* Determiners,
* Prepositions.

(iii) *Writing Skills.*—The knowledge on the modern formats and styles of writing is tested in this area of study
* Internal modes of Communication,
* Formal Correspondence Skills,

* Writing Descriptions/Explanations,
* Summary writing Skills,
* Report Writing Skills,
* Meeting Minutes/Agendas/Invitations,
* Comprehension.

(iv) *Reading Skills.*—Candidate's ability to comprehend a printed text, infer meaning and verbal/written interpretation is expected.
* Reading and understanding the specific and general meaning of a printed text,
* Reading and Interpretation (Verbal/Written),
* Understanding the cohesion and coherence of a passage.

*සටහන :* මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

12.1.7. දෙවන භාෂා පරීක්ෂණය :

මෙම විභාගය ලිඛිත පරීක්‍ෂණය සහ වාචික පරීක්‍ෂණය යන කොටස් දෙකකින් යුක්ත වේ. ලිඛිත විභාගය සමත් වන අයදුම්කරුවන් පමණක් අදාළ විෂයට අනුරූප වාචික පරීක්‍ෂණය සඳහා කැඳවනු ලැබේ. ලිඛිත පරීක්‍ෂණය සඳහා වන විෂයයන් පහත දැක්වේ.

| *විෂයය* | *කාලය* | *විෂය අංකය* |
|---|---|---|
| දෙවන භාෂා පරීක්ෂණය - සිංහල | පැය 02යි | 13 |
| දෙවන භාෂා පරීක්ෂණය - දෙමළ | පැය 02යි | 14 |
| දෙවන භාෂා පරීක්ෂණය - ඉංග්‍රීසි | පැය 02යි | 15 |

*සටහන.*-සිංහල භාෂා මාධ්‍යයෙන් සේවයට පත් කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියකු සම්බන්ධයෙන් දෙවන භාෂාව දෙමළ භාෂාව වන අතර දෙමළ මාධ්‍යයෙන් සේවයට පත් කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියකු සම්බන්ධයෙන් දෙවන භාෂාව සිංහල භාෂාව වේ. ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සේවයට පත් කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියකු සිංහල හා දෙමළ යන භාෂා දෙක පිළිබඳ පරීක්ෂණවලින් සමත් විය යුතු ය.

12.2 ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා වන පළමු කර්යක්ෂමතා කඩඉම් විභාගය සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය.

මෙම විභාගයන් සඳහා වන විෂයයන් පහත දැක්වේ.

| *විෂයය* | *කාලය* | *විෂය අංකය* |
|---|---|---|
| මූල්‍ය ක්‍රම | පැය 03 යි | 12 |
| පරිපාලනය | පැය 03 යි | 04 |

12.2.1 මූල්‍ය ක්‍රම (විෂය අංකය 12)
පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි. :—

(i) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය (X වැනි පරිච්ඡේදය හැර),
(ii) ගෙවී යන වර්ෂයේ ඇස්තමේන්තු උදා : ඒවා සකස් කිරීම, ශීර්ෂ මූල්‍ය ක්‍රම සහ විසර්ජන පනත්

*සටහන.*- මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

12.2.2 පරිපාලනය (විෂය අංකය 04)
පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි. :—

(i) කාර්යාල හා ක්ෂේත්‍ර කටයුතු සංවිධාන කිරීම හා සංවිධාන ක්‍රම,
(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009.02.20 දිනැති සහ 1589/30 අංක දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද කාර්ය පටිපාටික රීති සහ ආයතන සංග්‍රහයේ පහත දැක්වෙන පරිච්ඡේද VI, VII, IX, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII සහ XLVIII

*සටහන.*- මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

12.2.3 දෙවන භාෂා පරීක්ෂණය

මෙම විභාගයන් ලිඛිත පරීක්‍ෂණය සහ වාචික පරීක්‍ෂණය යන කොටස් දෙකකින් යුක්ත වේ. ලිඛිත විභාගය සමත් වන අයදුම්කරුවන් පමණක් අදාළ විෂයයට අනුරූප වාචික පරීක්‍ෂණය සඳහා කැඳවනු ලැබේ. ලිඛිත පරීක්‍ෂණය සඳහා වන විෂයයන් පහත දැක්වේ.

| *විෂයය* | *කාලය* | *විෂයය අංකය* |
|---|---|---|
| දෙවන භාෂා පරීක්ෂණය - සිංහල | පැය 02යි | 13 |
| දෙවන භාෂා පරීක්ෂණය - දෙමළ | පැය 02යි | 14 |
| දෙවන භාෂා පරීක්ෂණය - ඉංග්‍රීස | පැය 02යි | 15 |

*සටහන.*—සිංහල භාෂා මාධ්‍යයෙන් සේවයට පත් කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියකු සම්බන්ධයෙන් දෙවන භාෂාව දෙමළ භාෂාව වන අතර දෙමළ මාධ්‍යයෙන් සේවයට පත් කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියකු සම්බන්ධයෙන් දෙවන භාෂාව සිංහල භාෂාව වේ. ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සේවයට පත් කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියකු සිංහල හා දෙමළ යන භාෂා දෙක පිළිබඳ පරීක්ෂණවලින් සමත් විය යුතු ය.

12.3 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ඃ

(2005.11.14 දිනැති අංක 1419/3 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 'ඈ' පරිශිෂ්ටය.)

මෙම විභාගය සඳහා වන විෂයයන් පහත දැක්වේ. :-

| *අනු අංකය* | *විෂයය* | *කාලය* | *විෂයය අංකය* |
|---|---|---|---|
| 01 | ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) | පැය 03 යි | 08 |
| 02 | සංවර්ධන පරිපාලන පිළිබඳ ක්‍රියාවලිය (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) | පැය 03 යි | 09 |
| 03 | කළමනාකරණය හා සංවිධාන ක්‍රම | පැය 03 යි | 10 |
| 04 | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය | පැය 03 යි | 11 |

**12.3.1 ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) (විෂයය අංකය 08) :**

ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා බලපාන කරුණු මත පදනම් වූ ප්‍රශ්න පත්‍රයකි. ශ්‍රී ලංකාවේ මෑත කාලීන ආර්ථික, සමාජ හා දේශපාලන ඉතිහාසය තුළ ආර්ථික විද්‍යා හා සමාජ විද්‍යා මූලධර්මයන් උපයෝගී කරගත් ආකාරය පිළිබඳ කරුණු මත මෙම ප්‍රශ්න පත්‍රය සකස් වී ඇත.

*සටහන.*- මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

12.3.2 සංවර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියාවලිය (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) (විෂයය අංකය 09) :

ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානයක් සහිතව පහත කරුණු පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් සංවර්ධන පරිපාලනය භාර වූ ආයතන, ඒවායේ ක්‍රියාකාරීත්වය හා අන්තර් සම්බන්ධතාවයන් මත පදනම් වූ ප්‍රශ්න පත්‍රයකි. ඃ-

(i) ශ්‍රී ලංකාවේ රාජ්‍ය තන්ත්‍රය,
(ii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය තන්ත්‍රයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පසුබිම,
(iii) පළාත් සභා හා පළාත් පාලන,
(iv) මහජන සංවිධාන,
(v) රාජ්‍ය සංස්ථා.

*සටහන.*- මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

12.2.3 කළමනාකරණය හා සංවිධාන ක්‍රම (විෂයය අංකය 10)

*පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි. ඃ*

(i) කළමනාකරණය හා සංවිධානය පිළිබඳ මූලධර්ම,
(ii) එම මූලධර්ම රාජ්‍ය අංශයේ පැන නගින ගැටලු හා ප්‍රශ්නවලට අදාළ කර ගැනීම,

(iii) කළමනාකරණය පිළිබඳ නූතන ක්‍රමවේදයන් හා ශිල්ප ක්‍රම.

*සටහන.-* මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

12.3.4 රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය (විෂයය අංකය 11) ඃ

*පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි :*

(i) ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය—
රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ ව්‍යවස්ථාමය විධිවිධාන
රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තුවේ පාලනය
අරමුදල් යන්නෙහි අර්ථය
ඒකාබද්ධ අරමුදල සහ එහි ක්‍රියාකාරිත්වය
විසර්ජනයේ අරමුණ හා විසර්ජන ක්‍රම
අවිනිශ්චිත අවස්ථා අරමුදල
වෙනත් අරමුදල් හා ඒවායේ ක්‍රියාකාරිත්වය
රාජ්‍ය ආදායම
මුදල් ඇමතිවරයාගේ බලතල හා කාර්යය භාරය, භාණ්ඩාගාරයේ බලතල හා කාර්ය භාරය
වොරන්ට් සහ අග්‍රිම අධිකාරිය
විගණකාධිපති, ඔහුගේ බලතල හා කාර්ය භාරය
රාජ්‍ය වියදම් කමිටුව
රාජ්‍ය ව්‍යාපාර කමිටුව;

(ii) ගිණුම් නිලධාරීන්, ප්‍රධාන ගිණුම් නිලධාරීන් හා රාජ්‍ය ආදායම පිළිබඳ ගිණුම් නිලධාරීන් පත් කිරීම, ඔවුන්ගේ බලතල හා කාර්ය;

(iii) අභ්‍යන්තර විගණනය;

(iv) රාජ්‍ය වියදම් සැලසුම් කිරීම හා කළමනාකරණය—
සංවිධානවල අරමුණු හා කාර්ය භාරයන් හඳුනා ගැනීම
රාජ්‍ය ප්‍රතිපත්ති, පරමාර්ථ, ඉලක්ක හා වැඩ සටහන් හඳුනා ගැනීම
සංවර්ධන ව්‍යාපෘති, වැඩ සටහන් සැලසුම් කිරීම හා ඇගයීම හා ප්‍රමුඛතාකරණය
වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තු සැකසීම හා අවසන් තීරණ ගැනීම;

(v) අනුමත වියදම් ඇස්තමේන්තුවල වෙනස්කම් කිරීම—
වීරමෝං පරිපාටිය ක්‍රියාත්මක කිරීම
රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා හා වැටුප් කළමනාකරණය
මුළු පිරිවැය ඇස්තමේන්තු හා ඒවා ප්‍රතිශෝධනය කිරීම
පරිපූරක ඇස්තමේන්තු;

(vi) රජයේ දේපළවල පාඩු හා අත්හැරීම්;

(vii) විවිධ ගිණුම් කටයුතු;

(viii) මූල්‍ය කළමනාකරණය සඳහා කාර්ය භාරයන් පැවරීම;

(ix) රජයේ මුදල්වල හා භාරකාරත්වය හා බැංකු ගිණුම් පරිපාටිය

(x) රජයේ සැපයුම් ක්‍රියා පටිපාටිය—
භාණ්ඩ සේවා හා වැඩ ලබා ගැනීම
ටෙන්ඩර් මණ්ඩල හා තාක්ෂණ ඇගයුම් කමිටුවල සංයුතිය
පත්කිරීම බලතල හා කාර්ය භාරය
ටෙන්ඩර් ඇගයීමේ ක්‍රියා පටිපාටිය
විදේශ ආධාර මත ක්‍රියාත්මකවන ව්‍යාපෘතිවල කළමනාකරණය.

*සටහන.-* මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

13. මෙම විභාගය සඳහා වන විභාග කාල සටහන පහත පරිදි වේ :—

| අනු. අංකය | විභාගයේ නම | විෂයය | විෂයය අංකය | දිනය | වේලාව |
|---|---|---|---|---|---|
| 01. | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය | 01 | 2014.01.18 | 9.00-12.00 |
| | | ශ්‍රී ලංකාවේ නීති ක්‍රම | 02 | 2014.01.18 | 13.00-16.00 |
| | | අපරාධ නීතිය හා සාක්ෂ්‍ය නීතිය | 03 | 2014.01.19 | 9.00-12.00 |
| | | පරිපාලනය | 04 | 2014.01.19 | 13.00-16.00 |
| | | ආර්ථික විද්‍යාව | 05 | 2014.01.25 | 9.00-12.00 |
| | | සමාජ විද්‍යාව | 06 | 2014.01.25 | 9.00-12.00 |
| | | ඉංග්‍රීසි | 07 | 2014.01.25 | 13.00-16.00 |
| 02. | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | මූල්‍ය ක්‍රම | 12 | 2014.01.26 | 9.00-12.00 |
| | | පරිපාලනය | 04 | 2014.01.19 | 13.00-16.00 |
| 03. | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | මූල්‍ය ක්‍රම | 12 | 2014.01.26 | 9.00-12.00 |
| | | පරිපාලනය | 04 | 2014.01.19 | 13.00-16.00 |
| 04. | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | මූල්‍ය ක්‍රම | 12 | 2014.01.26 | 9.00-12.00 |
| | | පරිපාලනය | 04 | 2014.01.19 | 13.00-16.00 |
| 05. | ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණය | දෙවන භාෂා පරීක්ෂණය - සිංහල | 13 | 2014.02.02 | 14.00-16.00 |
| | | දෙවන භාෂා පරීක්ෂණය - දෙමළ | 14 | 2014.02.02 | 09.00-11.00 |
| | | දෙවන භාෂා පරීක්ෂණය - ඉංග්‍රීසි | 15 | 2014.02.02 | 11.30-13.30 |
| 06. | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති | 08 | 2014.01.26 | 9.00 - 12.00 |
| | | සංවර්ධන පරිපාලන පිළිබඳ ක්‍රියාවලිය | 09 | 2014.01.26 | 13.00-16.00 |
| | | කළමනාකරණය හා සංවිධාන ක්‍රම | 10 | 2014.02.01 | 09.00 - 12.00 |
| | | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය | 11 | 2014.02.01 | 13.00-16.00 |

14. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සහ දෙවන භාෂා පරීක්ෂණයට අදාළ විෂයයන්ගේ සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම පහත පරිදි වේ :—

| විභාගය | විෂයය | නිදහස් කරනු ලැබීමට අවශ්‍ය සුදුසුකම් |
|---|---|---|
| ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙවන භාෂා පරීක්ෂණය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය<br>ශ්‍රී ලංකාවේ නීති ක්‍රම<br>අපරාධ නීතිය හා සාක්ෂ්‍ය නීතිය | බැරිස්ටර්වරයකු, ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිනීතිඥවරයකු, විශ්වවිද්‍යාලයක නීතිය පිළිබඳ උපාධිධාරියකු වීම, |
| | ආර්ථික විද්‍යාව/සමාජ විද්‍යාව | ආර්ථික විද්‍යාව හෝ සමාජ විද්‍යාව පිළිබඳව උපාධිධරයකු වීම |

| *විභාගය* | *විෂයය* | *නිදහස් කරනු ලැබීමට අවශ්‍ය සුදුසුකම්* |
|---|---|---|
| | දෙවන භාෂා පරීක්ෂණය සිංහල<br>දෙවන භාෂා පරීක්ෂණය දෙමළ | (i) අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් පළමු භාෂාව හෝ දෙවන භාෂාව සමත්වීම;<br>(ii) රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ මූලික හෝ උසස් භාෂා පාඨමාලාවක් සමත්වීම;<br>(iii) රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ප්‍රාරම්භක හෝ ඉහළ මට්ටමක භාෂා පාඨමාලාවක් සමත්වීම;<br>(iv) අ. පො. ස. (සා. පෙළ) වෛකල්පිත සිංහල හෝ දෙමළ විෂයයෙන් සමත් වී තිබීම. |
| | දෙවන භාෂා පරීක්ෂණය ඉංග්‍රීසි | අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය හෝ ඊට වැඩි සාමාර්ථ්‍යයක් ලබා තිබීම |

*සටහන.*—2012.01.02 සහ ඊට පසු බඳවා ගනු ලබන නිලධාරීන්ගේ පත්වීම් ලිපිවල විධිවිධාන පරිදි අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගැනීම සඳහා මෙම විභාග නිවේදනයෙහි සඳහන් දෙවන භාෂා පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවශ්‍ය නොවන අතර එම නිලධාරීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හි සඳහන් විධිවිධාන අනුව එම ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

15. *ප්‍රතිඵල නිකුත් කිරීම.*—මෙම විභාගයට අයදුම්කළ/පෙනී සිටි සියලු අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළ කරනු ලැබේ. ප්‍රතිඵල නැවත සමීක්ෂණයට අවසර දෙනු නොලැබේ.

16. මෙම විභාග නිවේදනයට විධිවිධාන සළසා නොමැති කවර කරුණක් පිළිබඳ වුව ද, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2013 නොවැම්බර් මස 28 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

12-596

---

**ප්‍රවාහන අමාත්‍යාංශය - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II වන පන්තියේ "ආ" ඛණ්ඩයේ මෝටර් රථ පරීක්ෂකවරුන් බඳවා ගැනීමේ තරග විභාගය - 2013

2013.11.08 වැනි දින පළ කරන ලද නිවේදනය හා බැඳේ.

ඇමුණුම 01 - හතර වන ඡේදයේ "ඇ" වගන්තියේ දැනට රජයේ සේවයේ නියුක්තව සිටින නිලධාරීන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව මෙවර පවත්වනු ලබන විභාගයට පමණක් බලපැවැත්වෙනු නොලැබේ.

එස්. එච්. හරිස්චන්ද්‍ර,
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්.

2013 නොවැම්බර් මස 26 වැනි දින,
තැ. පෙ. 533, ඇල්විටිගල මාවත,
කොළඹ 05.

12-413

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.